ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2024.08.06

පැමිණිලිකරු - ඩබ්.ඒ.ජයවර්ධන මයා,
නො.20/A,
ඊ.ඩී.දාබරේ මාවත, නාරාහේන්පිට.

වගඋත්තරකරු - 01. අධ්‍යාපන ලේකම්,
බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
204, බෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

02. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය,
විතානගේ මාවත, කොළඹ 02.

පැමිණිලි අංක : එච්.ආර්.සී/2302/11

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

තමා 1983 වසරේ ස්ථාන මාරු වීමකින් ශ්‍රී පරාක්‍රමබාහු විද්‍යාලය නාරාහේන්පිට මුරකරුවෙකු ලෙස සේවයට වාර්තා කළ බවත්, තමා දැනට පදිංචි නිවස 1983.12.01 දින සිට ලැබුණු බවත්, 1992 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා එම නිවසේ පදිංචියට අදාළව අධ්‍යාපන දෙපාර්තුමේන්තුවට රු.50/= ක මුදලක් අය කර ගත් බවත්, පසුව මෙම නිවස අයත් වන්නේ දුම්රිය දෙපාර්තුමේන්තුව විසින් බව දැනගැනීමෙන් පසු අධ්‍යාපන දෙපාර්තුමේන්තුවට තමාගෙන් රු. 50/= ක මුදල අය කර නොගන්නා ලෙස කළ දැන්වීමෙන් පසු එම මුදල අය කර නො ගත් බවත්, පැමිණිලිකරු පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත. පසුව පැමිණිලිකරු 2010.12.24 දින සිට විශ්‍රාම ගන්වා ඇති නමුත්, මේ දක්වා තමාගේ විශ්‍රාම වැටුප හිමි නොවුණු බවත්, පැමිණිලිකරු පදිංචි නිවසෙන් නෙරපීම සඳහා අධ්‍යාපන දෙපාර්තුමේන්තුව මහේස්ත්‍රාත් අධිකරණයට B 605515/14 නඩු පවරා ඉවත් කිරීමේ නියෝගයක් ලබා ගත් බවත්, පසුව පැමිණිලිකරු විසින් මෙම නියෝගයට එරෙහිව මහාධිකරණයේ නඩු පවරා නඩු අංක - HCRA/125/14 මගින් අදාළ මහේස්ත්‍රාත් අධිකරණ තීරණය අත්හිටුවීමේ නියෝගයක් ලබාගත් බවත්ය. එකී අභියාචනයද නිෂ්ප්‍රභා වී ඇති බව වාර්තා වන අතර, පැමිණිලිකරු ඒ සම්බන්ධව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුප අනීතිකව ලබා නොදීමට වගඋත්තරකාර පාර්ශවය කටයුතු කර ඇති බව දක්වා සිටියි.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිලිකරු අධ්‍යාපන දෙපාර්තුමේන්තුවේ මුරකරු වශයෙන් සේවය කළ බවත්, ඔහු විසින් සේවය කරන ලද පාසලේ සේවය කිරීමට නිල නිවසක් ඉල්ලීම් කල පසු එම නිවසේ කලින් පදිංචිව සිටි මුරකරු ඉවත් කර පැමිණිලිකරුට එම නිවස ලබා දුන් බවත්, මෙම පැමිණිලිකරු 2010.12.24 විශ්‍රාම ගැනීම කල බවත්, 2011.06.20 දින මුරකරු නිවසින් ඉවත් වී මුරකරු නිවස හා සන්තකය විධිමත් පරිදි විදුහල්පතිවරයා වෙත භාරදීමට දැන් වූ නමුත් ඒ පිළිබඳ කටයුතු නොකිරීම නිසා කො/පරාක්‍රමබාහු විදුහලේ ගුරු නිවස සම්බන්ධයෙන් රජයේ ඉඩම් සන්තකය ලබා ගැනීමේ පනත යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B 6655/5/14 යටතේ ඉවත් කිරීමේ නියෝගයක් ලබා ගත් බවත්, පසුව පැමිණිලිකරු මහාධිකරණයේ අත්හිටුවීමේ නියෝගයක් ලබා ගත් බවත්, මහාධිකරණයේ HCRA/125/14 යටතේ නඩුවක් විභාග වී තිරණයක් ලබා දුන් බවත්, ඒ සඳහා ද පැමිණිලිකරු අභියාචනා කළ බවත් දක්වා ඇත. ඒ අනුව අදාල නඩුව හේතුවෙන් නිවස භාර නොදීම මත විශ්‍රාම වැටුප ලබා නොදුන් බවත්, ඉහත නඩුවේ තීරණය මත ඉදිරි කටයුතු කරන බවත්,වැඩිදුරටත් දක්වා ඇත.

**විමර්ශනය:-**

පැමිණිලිකරු කොමිෂන් සභාව් පැමිණිලි කරමින් දක්වා සිටිනුයේ 2010.12.24 දින විශ්‍රාම ගිය ද මේ දක්වා තමාගේ විශ්‍රාම වැටුප් හිමිකම තමාට ලබා දී නොමැති බවයි.

- වගඋත්තර පාර්ශවයට අනුව විශ්‍රාම වැටුප පැමිණිලිකරුට ලබා දීමට කටයුතු කර නොමැත්තේ පැමිණිලිකරුට ලබා දුන් නිල නිවස නැවත භාර නොදීම නිසා බවත්, ඔහුව නෙරපීම සඳහා අධිකරණයේ නඩු කටයුත්තක් පවතින බැවින් විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් කටයුතු කර නොමැති බවත්ය.

- මෙහි දී පැමිණිලිකරු දක්වනුයේ මෙම නිවස අධ්‍යාපන දෙපාර්තුමේන්තුවට අයත් නිවසක් නොවන බවත්,එය දුම්රිය දෙපාර්තුමේන්තුවට අයත් නිවසක් බවයි.

- එම නිවසේ අයිතිය පිළිබඳව මේ දක්වා නිරවුල් අයිතියක් සඳහන් නොවන බව ලේඛන අනුව පැහැදිලි වේ.

- තවද මෙම පැමිණිලිකරුට අයත් පුද්ගලික ලිපිගොනු බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති නිලධාරි වෙත යොමු කිරීමෙන් අනතුරුව නිල නිවසට අයත් නඩු කටයුත්ත හේතුවෙන් වසර 14 ක මුලුල්ලේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට නොයවා තබාගෙන ඇති බවත් පෙනී යයි.

- එසේ තිබිය දී වගඋත්තර පාර්ශවය මෙම නිවසින් නෙරපීම සඳහා පැමිණිලිකරුට එරෙහිව අධිකරණයට ගොස් ඇති අතර පැමිණිලිකරු ඒ සඳහා තහනම් නියෝග මෙන් ම තවදුරටත් අභියාචනා කර ඇති බැවින් මේ දක්වා නිල නිවස සම්බන්ධව නඩු කටයුත්තක් පවතින බවට කරුණු නිරීක්ෂණය වේ.

- 2011.01.13 දාතමින් ශ්‍රී පාරක්‍රමබාහු මහා විද්‍යාලයේ විදුහල්පති විසින් මුරකරු භාරයේ තිබූ සියලුම බඩු, මුදල් යතුරු භාර දී ඇති බවත්, නිවාඩු පිළිබඳවත් දුම්රිය බලපත්‍ර කට්ටල ලබා ගෙන නැති බවත්, එ බැවින් මුරකරු නියමිත දින සිට විද්‍යාලයේ සේවයෙන් මුදා හරින බවත්, දක්වා ඇත.

- 2011.02.15 දිනැතිව 01 වන වගඋත්තර පාර්ශවය ඩබ්.ඒ ජයවර්ධන මහතාගෙන් රජයට අයත් විය යුතු මුදලක් වේ නම් එම මුදල ඔහුගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂකයක් අයකර ගැනීමට යටත්ව 2010.12.23 දින සිට එම තනතුරෙන් විශ්‍රාම ගැන්වීම අනුමත කරන බව දක්වා ඇත. ඒ අනුව එහි දී එවකට 01 වන වගඋත්තර පාර්ශවය විශ්‍රාම ගැන්වීම අනුමත කර ඇති බව නිරීක්ෂණය වේ.

- විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12(1) වගන්තිය ප්‍රකාරව දක්වා ඇත්තේ,
  "රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා කාලයේ දී නොසැලිකිලිමත්කම,අක්‍රමිකතාවය හෝ විෂමචාර හෝ නිසා ආණ්ඩුවේ නිලධාරියෙකුට විරුද්ධව විනයානුකූලව ලෙස කටයුතු කරන අවස්ථාවක තුෂ්ටිදායක නොවෙතයි, නියම නිලධාරියෙකු කල්පනා කළහොත් මේ ව්‍යවස්ථාවන් යටතේ ඒ සේවකයාට ගෙවිය හැකි යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතොෂිකයක් හෝ වෙනත් දීමනාවත් නතර කිරීමට ගත් අඩුකිරීමට හෝ බලය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබද අමාත්‍යංශ ලේකම්ට ඇත්තේ ය."

ඒ අනුව විශ්‍රාම වැටුප හෝ විශ්‍රාම වැටුප නැවැත්විය යුතු හැකි කාරණාවන් කවරේ ද යන්න විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12(1) වගන්තියේ පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව මෙම නිල නිවාසය නොදීම යන්න 12(1) වගන්තිය යටතේ දක්වා ඇති විශ්‍රාම වැටුප් නැවැත්වීමට අදාළ කරගත හැකි කරුණක් නොවේ. ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට වෙනම නීතිමය ප්‍රතිපාදන පවතින අතර, නිල නිවාසය භාර නොදීමේ හේතුව මත විශ්‍රාම වැටුප් අත්හිටුවීම නීතියට පටහැනි වේ.

ඒ අනුව මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු සම්බන්ධව නිවසේ භාරකාරිත්වය පිලිබඳ ප්‍රශ්නගත අවස්ථාවක නෙරපීමට අදාළව පවතින නඩු කටයුත්ත හේතුවෙන් වසර 14කට ආසන්න කාලයක් විශ්‍රාම වැටුප් නොගෙවීම මෙහි දී ප්‍රශ්නගත වේ.

<u>විල්බට් ගොඩවෙල එදිරිව චන්ද්‍රදාස හා තවත් අය (1995) 2SLR</u> නඩුවේ දී අමරසිංහ විනිසුරුතුමා දක්වා ඇත්තේ,

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 12(1) විශ්‍රාම වැටුප නවතාලීම හෝ අඩු කල හැක්කේ,

1. විශ්‍රාම ගැනීමේ දී ඔහු/ඇය සම්බන්ධ විනය ක්‍රියාවක් තවදුරටත් පවතින හෝ සම්පූර්ණ වී ඇත්නම්

2. එහි දී රාජ්‍ය සේවකයා විසින් ඉදිරිපත් කරන ලද පැහැදිලි කිරීම පිලිබඳ සෑහිමකට පත් විය නොහැක්කේ නම් බවයි.

තව ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 29/90 හි විශ්‍රාම වැටුප කඩිනමින් ලබා දීම සම්බන්ධව රාජ්‍ය නිලධාරින් කඩිනමින් ක්‍රියාත්මක විට පිලිබඳ දක්වා ඇත. එහි දී දක්වා ඇත්තේ රාජ්‍ය නිලධාරින් සියලු දෙනාට විශ්‍රාම වැටුප ලබා දීම සම්බන්ධව මානුෂීය හා අනුකම්පා සහගත සිතුවිල්ලෙන් විශ්‍රාම වැටුප කඩිනමින් ලබා දීමට කටයුතු සිදු කල යුතු බවයි.

<u>ඉස්මයිල් මජිඩ් සහ තවත් අය</u> 389/2015 නඩුවේ දී ගුණරත්න විනිසුරුතුමා දක්වා සිටියේ,

"ඉහත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන මඟින් අවධාරණය කර ඇත්තේ,කිසිඳු විශ්‍රාම වැටුපක් ලබා දීමේ දී ප්‍රමාණාත්මක අඩුලුහුඩු රාජ්‍ය නිලධාරින් සිදු නොකල යුතු බවයි.

මෙහිදි තවදුරටත් නිරීක්ෂණය වන්නේ බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන නීති නිලධාරි වගකීම් විරහිතව ක්‍රියාකර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් අදාළ බලධාරීන් අවධානය යොමු විය යුතුව පවතින බවත්ය. 2010 රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වීමෙන් පසු වසර 14 ක් ඩබ්.ඒ.සිරිවර්ධන මහතාහට විශ්‍රාම වැටුප් නොගෙවීම තුළ නිසි සංවේදි බවකින් රාජ්‍ය නිලධාරීන් ලෙස වගඋත්තරකාර පාර්ශවය කටයුතු කර නොමැති බවත් මහජන බදු මුදලින් නඩත්තු වන මෙම රාජ්‍ය නිලධාරින්ගේ ක්‍රියාකාරීත්වය කණගාටුදායක බවත් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

ඒ අනුව 2010.12.03 දින විධිමත්ව විශ්‍රාම ගන්වා තිබීය දී රජයේ ඉඩමකින් නෙරපීම් නඩුව හේතුවෙන් අවුරුදු 14කට ආසන්න කාලයක් පැමිණිලිකරුට නීතියටද පටහැනිව විශ්‍රාම වැටුප ලබා නොදීම තුල පැමිණිලිකරු සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව නිගමනය කරමු.

<u>නිර්දේශය :-</u>

පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපට අදාළ පෞද්ගලික ලිපිගොනුව 2024.08.30 දිනට පෙර සකස් කොට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යැවීමට වගඋත්තරකාර පාර්ශවය කටයුතු කළ යුතු බව නිර්දේශ කරමු.

2024.08.30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මකකර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත - 01. අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත, කොළඹ 10.
} දැනගැනීම සඳහා

02. ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත් සභාව
අංක - 204, 4 වන මහල
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
} දැනගැනීම සඳහා හා අවශ්‍ය පියවර ගැනීමට